2024.09
Library copy

# මීගමුව අධ්‍යාපන කලාපය
## දෙවන වාර ඇගයීම 2024
## ඉතිහාසය - 10 ශ්‍රේණිය

Learning Resource Center
R
De Mazenod College
Kandana

විභාග අංකය ....................

කාලය පැය 01

පොදු උපදෙස්
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න
- 1,2, 3, 4 පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා එම අංකය මත X ලකුණ යොදන්න.

I පත්‍රය

(1)ක්‍රි.ව හතරවන සියවසදී රචනා වී තිබීම, තොරතුරු කෙටියෙන් දක්වා තිබීම, පැරණිතම වංසකතාව වීම යන කරුණු අදාල වන්නේ කවර මූලාශ්‍රයක් සම්බන්ධයෙන් ද?
1. දීපවංසය 2. මහාවංසය
3. දාඨාවංසය 4. බෝධිවංසය

(2) මෙරට ශාසන ඉතිහාසයට මුල්තැන දෙමින් රචිත ග්‍රන්ථයක් වන්නේ,
1 රාජාවලිය 2. දීපවංසය
3. සද්ධර්මරත්නාවලිය 4. නිකාය සංග්‍රහය

(3) මහාවංසයේ ඇතැම් තැන් විස්තර කොට අර්ථ විවරණය සඳහා සම්පාදනය කළ මහාවංස ටීකාව හඳුන්වා ඇති නම
1. සීහලට්ඨකතා මහාවංසය 2. වංසත්ථප්පකාසිනිය
3. විනයට්ඨකතා 4. සමන්තපාසාදිකාව

(4) රෝම ජාතික ප්ලිනි විසින් ලංකාව පිළිබද සඳහන් කරමින් රචිත කෘතිය වන්නේ,
1. ඉන්ඩිකා 2. ඩිමුන්ඩෝ
3. භූගෝලශාස්ත්‍ර ප්‍රවේශය 4. නැචුරාලිස් හිස්ටෝරියා

(5) පහත සඳහන් වගන්ති අතරින් සාවද්‍ය වගන්තිය තෝරන්න.
1. මහාවංසයේ ඇතැම් ඓතිහාසික තොරතුරු ශිලාලිපි මගින් තහවුරුවී ඇත.
2. මහාවිහාරයට අයත් දික්සද සෙනවියා පිරිවෙනේ විසූ මහානාම හිමියන් මහාවංසයේ මුල් කොටස රචනා කරන ලදී.
3. මහාවංසය රචනා කොට ඇත්තේ ක්‍රි.ව හතරවන සියවසයේදී ය.
4. රටක ඉතිහාසය අඛණ්ඩව ලියවී ඇති රටවල් අතරින් එකක් ලෙස ශ්‍රී ලංකාව සැලසේ.

(6) ලෙන් ලිපි හෙවත් කටාරම් ලිපි වල වැඩි වශයෙන් දැක්වෙන්නේ
1. ලෙන් පිදූ පුද්ගලයින් පිළිබඳවය 2. රජවරුන් පිළිබඳ තොරතුරුය
3. ඉඩම් ප්‍රදානය කළ අය පිළිබඳවය 4. රජයේ ආඥා පිළිබඳවය

(7) ශ්‍රී ලංකාව මිනිස් වාසයක් බවට පත්වූයේ යැයි සැළකෙන්නේ කුමන කාල වකවානුවක සිටද?
1. වසර එක් ලක්ෂ විසිපන්දහසකට පෙර සිට 2. වසර අසූ දහසක පමණ සිට
3. වසර පන් දහසක පමණ සිට 4. වසර දෙලක්ෂ විසි පන්දහසක පමණ සිට

(8) කලපු බෙල්ලන්, ලුණු භාවිතය සිදු කළ බවට තොරතුරු සඳහන් වන ප්‍රාග් ඓතිහාසික ස්ථානය තෝරන්න.
1. කුරුවිට බටදොඹ ලෙන 2. පාහියන්ගල ලෙන
3. සීගිරි පොතාන ලෙන 4. කිතුල්ගල බෙලිලෙන

(9) ඉරණමඩු සැකැස්මට අයත් බොරළු තට්ටුව සහිත ගල් යුගයට අයත් සාක්ෂි හමුවූ ස්ථානයක් වන්නේ,

1. පතිරාජවෙල　　2. පාහියන් ලෙන
3. බටදොඹ ලෙන　　4. රාවණා ඇල්ල

(10) මල සිරුරු දිරා යන තුරු වළලා පසුව ගොඩ ගෙන හිසකබල සුමට කිරීම, එහි ගුරුගල් ආලේප කිරීම යන චාරිත්‍ර පිළිබඳ සාධක ලැබෙන්නේ මින් කවර කාලයකද?

1. පූර්ව ඓතිහාසික යුගයට　　2. ප්‍රාග් ඓතිහාසික යුගය
3. ඓතිහාසික යුගය　　4. මුල් ඓතිහාසික යුගය

(11) වියළි කලාපයේ කුඩා ගම් වැව් කේන්ද්‍ර කරගෙන ජනාවාස ව්‍යාප්ත වූයේ මින් කුමන යුගයේදී ද?

1. ප්‍රාග් ඓතිහාසික යුගයේදී　　2. පූර්ව ඓතිහාසික යුගයේදී
3. ඓතිහාසික යුගයේදී　　4. මුල් ඓතිහාසික යුගයේදී

(12) යකඩ භාවිතය පිළිබඳව මුල් වරට පැහැදිලි පුරාවිද්‍යාත්මක සාධක ලැබෙන්නේ,

1. ප්‍රාග් ඓතිහාසික යුගයේදී　　2. පූර්ව ඓතිහාසික යුගයේදී
3. මුල් ඓතිහාසික යුගයේදී　　4. ඓතිහාසික යුගයේදී

(13) දඩයමින් ජීවත්වූ ආදි මානවයා ගොවිතැන කෙරෙහි යොමු වීමට බලපෑ මූලික පරිසර හේතු සාධක වන්නේ,

1. ජන සංඛ්‍යාව වර්ධනය වීම
2. පසේ සාරවත් බව වැඩිවීම
3. පැවති සීත දේශගුණය වෙනස්වී උණුසුම් දේශගුණයක් ඇරඹීම
4. දඩයමට සතුන් හිඟ වීම

(14) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් මල සිරුරු නවා වකුටු කර වළලන අභිචාරර විධි අනුගමනය කළ බවට සාක්ෂි හමුවී ඇත්තේ,

1. රාවණා ඇල්ල ගුහාවෙනි　　2. කිතුල්ගල බෙලිලෙනෙනි
3. කුරුවාට බටදොඹ ලෙනෙනි　　4. පාහියන් ලෙනෙනි

(15) පැරණි ආභරණ වලට අයත් නොයෙක් දේ පුරාවිද්‍යාත්මක කැනීම් වලින් හමුවී ඇත. දඹුල්ලට නුදුරු ඉබ්බන්කටුව සොහොන්බිමෙන් සොයා ගත් ලැබුවේ,

1. කැල්ලකි　　2. ඇස් අඳුන් කූරකි
3. කරාබුවකි　　4. පබළු යෙදූ ගෙල මාලයකි

(16) වංසකතා හා සෙල්ලිපි වල සඳහන් වන පරිදි කේවට්ටගාමයෙහි විසූ වෘත්තිකයින් වූයේ,

1. ධීවරයින් ය.　　2. වඩුවන් ය.
3. ගොවීන් ය.　　4. ගොපල්ලන් ය.

(17) වැව් ප්‍රපතනය ලෙස ලෙස හැඳින්වෙන්නේ,

1. කුඩා වැව් කීපයක් ඒකාබද්ධ කොට විශාල වැවක් ඉදි කිරීම
2. සෑම ගමකටම වෙන්ව පවතින වැවක් බැගින් නිර්මාණය කිරීම
3. ප්‍රධාන වැවට එන රොන් මඩ එකතු කර ගැනීමට වැවට ඉහළින් කුඩා වැව් සෑදීම.
4. සමීපව තිබෙන වැව් කීපයක් ඇළ මාර්ග මගින් සම්බන්ධ කොට වැව් පද්ධතියක් සෑදීම

(18) සෙල්ලිපියක "අලකපය මහරජ" යන යෙදුම භාවිතා කර තිබෙන්නේ කවර රජු හැඳින්වීම සඳහාද?

1. මහසෙන් රජු　　2. පළවන කාශ්‍යප රජු
3. වසභ රජු　　4. දේවානම්පියතිස්ස රජු

(19) සමන්තපාසාදිකාවෙ සඳහන් අන්දමට ගමක් නියෝජනය කිරීමට නායකයෙකු තෝරා ගන්නා ලද්දේ,

1. ගෘහපතීන් අතරින් 2. ගමිකයින් අතරින්
3.පරුමකයින් අතරින් 4. ගමලද්දන් අතරින්

(20) ප්‍රාදේශීය පාලනයට කාන්තාවන් සහභාගී වූ බවට තොරතුරු ලබා ගතහැකි සෙල්ලිපිය කුමක්ද?

1. තෝනිගල සෙල්ලිපිය 2. ගල්පොත ලිපිය
3.බදුලු වැම් ලිපිය 4. බ්‍රාහ්මණයාගම ලිපිය

(21) ගමික සිව, ගමික සුමන, ගමික තිදන යන ගම් නායකයින් එක්ව භික්ෂූන්වහන්සේ නමකට ගල් ගුහාවක් පූජාකල බව දැක්වෙන ලිපිය පිහිටියේ,

1. සිතුල්පව්ව විහාරයට අයත් කොරවක්ගල නමින් හැඳින්වෙන ගල් ලෙනෙහි ය.
2. දඹුල්ලට නොදුරු කොත්ගල් කන්ද විහාරයේය.
3.කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි ගනේකන්ද විහාරයේ ය.
4. මාතලේ දිස්ත්‍රික්කයට අයත් ඇඹුල්අඹේ ප්‍රදේශයේය.

(22) දුටුගැමුණු රජතුමාගේ රාජතාන්ත්‍රික බව ප්‍රකට වන කදිම අවස්ථාවක් වන්නේ,

1. වෙහෙර විහාර ඉදිකරමින් බුදු දහමට අනුග්‍රහ දැක්වීමයි.
2. එළාර පරදවා ලංකාව පළමු වරට එක්සේසත් කිරීමයි.
3. රුවන්වැලිසෑය ඉදි කිරීමට සහයවූ සැමට වැටුප් ගෙවීමට නියම කිරීමයි.
4. තම ප්‍රතිමල්ලවයා වූ එළාර ගේ සොහොනට නිසි ගෞරව දැක්වීමට අණ කිරීමයි.

(23) රාජත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රධාන ප්‍රතිඵලයවූයේ,

1. බලය විමධ්‍යගත වීමයි. 2. පාලකයන් අතර ගැටුම් ඇතිවීමයි.
3. බලය මධ්‍යගතවීමයි. 4. ප්‍රාදේශීය පාලකයින් බලවත් වීමයි.

(24) ශ්‍රී ලංකාවේ ඇතැම් පාලකයින් අසල්වැසි රටවල් සමග විවාහ සබඳතා ඇතිකර ගැනීමෙන් අනාවරණය වන්නේ,

1. විදේශ කුමාරිකාවන් සරණපාවා ගැනීම මෙරට චාරිත්‍රයක්ව පැවති බවයි.
2. ඥාති සබඳතා තුළින් දේශපාලන බලය ස්ථාවර කරගත් බවයි.
3. අසල්වැසි රටවල පාලකයින් හා ලාංකික පාලකයින් අතර සුහදතාවයක් පැවති බවයි.
4. ලාංකික රජවරුන්ගේ බලය විදේශ රටවලද ව්‍යාප්තවූ බවයි.

(25) අලුතින් ගිනි තබා සකස්කරගත් හේන "නව දැලි හේන" යනුවෙන් හඳුන්වා ඇත්තේ,

1. උම්මග්ග ජාතකයේය 2.සෙල්ලිපි වලය
3.සමන්තපාසාදිකාවේය. 4.සද්ධර්මරත්නාවලියේය.

(26) ක්‍රි.ව නමවන සියවසේ සෙල්ලිපි වල "සභාව" ලෙස හඳුන්වා ඇත්තේ,

1. විධායකයයි 2.අධිකරණයයි.
3. ව්‍යවස්ථාදායකයයි. 4. රාජසභාවයි

(27) මහාත්ත්ථ වරායට ආසන්නව පිහිටා ඇති පැරණි හින්දු කෝවිල කුමක්ද?

1. නල්ලූර් කෝවිල 2. කෝනේෂ්වරම් කෝවිල
3.මුන්නේෂ්වරම් කෝවිල 4. තිරුකේතීෂ්වරම් කෝවිල

(28) විසි වතාවක් චීනය සමග රාජතාන්ත්‍රික දූත සබඳතා පැවැත්වූ අනුරාධපුර පාලකයා කවුද?

1. පළවන ගජබාහු රජු 2. මානවම්ම රජු
3.පළවන සේන රජු 4. හයවන අග්බෝ රජු

(29) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ විවිධ ශිල්පීන් හැඳින්වීම සඳහා භාවිතා කරන ලද නම් I තීරුවේත් ඔවුන් නියැලුන ශිල්ප ක්ෂේත්‍ර II තීරුවේත් දක්වා ඇත. එම තීරු නිවැරදිව ගැලපූ විට පිළිතුර කුමක්ද?

| I | II |
|---|---|
| 1 කබර | A රන් කර්මාන්තය |
| 2 චිතකර | B යකඩ කර්මාන්තය |
| 3 තුලදර | C ඇත්දත කැටයම් කර්මාන්තය |
| 4 දටික | D චිත්‍ර ශිල්පය |
| | E මැටි කර්මාන්තය |

1. ABCD
2. BCAE
3. BDAC
4. EDAC

(30) ශ්‍රී ලංකාවේ වරාය ආශ්‍රිතව ගොඩනැගුණු ජනාවාස හැඳින්වූයේ කුමන නමින්ද?
1. පට්ඨනගාම
2. කසීකාරගාම
3. කේවට්ටගාම
4. මණිකාරගාම

(31) බෞද්ධ ජනයාගේ මහත් ගෞරවාදරයට පත් ශ්‍රී පාද ස්ථානය ආදම්ගේ කන්ද නමින් හඳුන්වා වන්දනාමාන කරනු ලබන්නේ,
1. හින්දු ආගමික බැතිමතුන් ය.
2. රෝමානු කතෝලික බැතිමතුන් ය.
3. රෙපරමාදු කතෝලික බැතිමතුන් ය.
4. මුස්ලිම් බැතිමතුන් ය.

(32) පහත සඳහන් ස්ථාන අතරින් ස්වභාවික සුළං බලයෙන් උදුන් දල්වා යකඩ නිස්සාරණය කළ බවට සාධක හමුවන ප්‍රදේශය කුමක්ද?
1. දෙනිගහ ඇළකන්ද
2. බලංගොඩ සමනල වැව
3. බෙරගල
4. උඩරංචාමඩම

(33) ක්‍රි.පූ 1350 දී ඉදිකරන ලද සොහොන් ගර්භයක ඇටසැකිලි පිළිස්සීමේදී මැටි තලයක් සවිකර තිබීමෙන් පැහැදිලි වන්නේ,
1. උචිත මැටිවර්ග යොදාගත් බවය
2. සමබරතාවය ආරක්ෂා වන අයුරින් සොහොන් ගර්භය ඉදිකල බවය.
3. දහනය සඳහා ඔක්සිජන අවශ්‍ය බව පිළිදය පැවති අවබෝධය ය.
4. සොහොන් ගර්භයේ බිත්ති ශක්තිමත්ව ඉදිකල බවය.

(34) අතීතයේදී මැටි බඳුන් තැනීමේදී අනුගමනය කර ඇති ප්‍රායෝගික පියවර පිළිවෙලින් පෙලගැස්වූ විට නිවැරදි පිළිතුර වන්නේ,
A. නියමිත උෂ්ණත්වයට බඳුන පුළුස්සා ගැනීම
B. මැටි පදම් කර ගැනීම
C. සුදුසු මැටි වර්ගයක් සොයා ගැනීම.
D. පිළිස්සීමට උඳුනක් තනාගැනීම

1. ABCD
2. CBDA
3. BCDA
4. DBCA

(35) පැරණි කාලයේ ළිංකැට ළිං තැනීමෙන් බලාපොරොත්තුවූයේ කුමක්ද?
1. අපවිත්‍ර ජලය පිරිසිදු කර ගැනීම.
2. භික්ෂූන්වහන්සේලාගේ පැන් පහසුව සැළසීම.
3. ජලයේ නියමිත ප්‍රමිතිය හා සිසිලනය ආරක්ෂා කර ගැනීම.
4. ජලය අරපිරිමැස්සෙන් භාවිතා කිරීම.

(36) ආලාහන පිරිවෙන නමින් හැඳින්වෙන නටඹුන් සහිත භූමිය පිහිටා ඇති ප්‍රදේශය කුමක්ද?
1. පොළොන්නරුව
2. අනුරාධපුරය
3. යාපහුව
4. දඹදෙණිය

REGISTRAR
De Mazenod College
Kandana.

2024.09

(37) අඹන් ගඟේ ඇති ජලය ඇළහැර ඇළෙන් ගෙනගොස් පෝෂණය කරනු වැවක් නොවන්නේ,

1. මින්නේරි වැව
2. කවුඩුලු වැව
3. කන්තලේ වැව
4. හුරුළු වැව

(38) අතීත සමාජ ධූරාවලියට අනුව පහළ මට්ටමේ සිටින පිරිස හඳුන්වා ඇති නම කුමක්ද?

1. ප්‍රභූන්
2. දාසයින්
3. කුඩීන්
4. අන්තේවාසිකයින්

(39) අතීතයේ පැවති බදු නීතිය අනුව වැව් වල ජලය භාවිතා කරන්නන්ගෙන් අයකළ බද්ද හැඳින්වෙන්නේ,

1. දකපති
2. බොජකපති
3. මතෙරමජිබක
4. ගෘහ දණ්ඩ බද්ද

(40) ශ්‍රී ලංකාවේ කාන්තාව විශේෂ ගෞරවාදරයට පත් වීමට බලපෑ ප්‍රභලතම සාධකය වන්නේ,

1. කුල සිරිත ආරක්ෂා කරමින් ජීවත්වීමයි.
2. ස්වාමි පුරුෂයාට ගෞරව කරමින් ජීවත් වීමයි.
3. මව්වරුන් ලෙස වගකීම් දරමින් කටයුතු කිරීමයි.
4. සූප ශාස්ත්‍රය පිළිබඳ දක්ෂතා දැක්වීමයි.

REGISTRAR
De Mazenod College
Kandana.

Library Copy
2024.09.
Learning Resource Center
R
De Mazenod College
Kandana

# මීගමුව අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම 2024

### ඉතිහාසය - 10 ශ්‍රේණිය

කාලය පැය 03 | II පත්‍රය | විභාග අංකය ........................

පොදු උපදෙස්

- I කොටසේ පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව 6 කි.

## I කොටස

(1) අ. පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහිද, (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියමෙහිද ලකුණු කර නම් කරන්න.

(I) සූකරතිත්ථ, කිරිඳි ඔය, කලා ඔය, යෝධ වැව, මිහිඟගල්කන්ද, බුන්දල, කාලතිත්ථ, සල්ටතොට, කෝණේශ්වරම්, මිනිපේ අමුණ, සොරබොර වැව, මහාතිත්ථ වරාය.

(II) බෙංගාලබොක්ක, ඉතාලිය, අරාබිය, කැලිකට්, චීනය, මලක්කා සමුද්‍ර සන්ධිය

(ලකුණු 18)

ආ. i. A,B,C හා D යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරු වලට අදාල පුද්ගලයින් අනුපිළිවෙලින් ඔබේ පිළිතුරු පත්‍රයේ දක්වන්න.

A ගල්පොත සෙල්ලිපිය කරවූ පොළොන්නරුවේ පාලකයා

B දසවෙනි රාජ වර්ෂයේදී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කිරීම සිදු කළ රජු

C කිසිම සතෙකු නොමැරිය යුතු බවට මාඝාත නීතිය පැනවූ රජතුමා

D රෝමයෙන් පබළු ගෙන්වා රුවන්වැලිසෑයට පූජාවක් කළ රජතුමා (ලකුණු 4)

ඇ. A හා B යටතේ ඇති රූප අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

ii.



A

1. A රූපයෙන් දැක්වෙන්නේ කුමක්ද?
2. මෙය සම්බන්ධ ඓතිහාසික යුගය කුමක්ද?
3. මෙවැනි දේ දක්නට ඇති වෙනත් ස්ථානයක් නම් කරන්න.
4. මෙය කුමන කාර්යයක් සඳහා භාවිතා කර තිබේද?

iii.



B

1. B රූපය නම් කරන්න.

2. මෙය පිහිටියේ කුමන නගරයකද?

3. මෙය කවර ගංගාවක් හා සම්බන්ධ වේද?

4. මෙය තැනීමෙන් නිරූපනය වන්නේ කවර තාක්ෂණයක් ද?

(ලකුණු 8)

II කොටස

(2) i. සෙල්ලිපි වර්ග තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. A සිට D දක්වා ඇති ප්‍රකාශ වලට නිවැරදි පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

A අනුරාධපුර මුල් යුගයේ ශිලා ලිපි වල භාවිතා වූ අක්ෂර මාලාව හඳුන්වන නම

B කාසි අච්චු ගැසීමේ ප්‍රධානියා හඳුන්වන නම

C පුරාවිද්‍යාත්මක කැනීම් වලින් හමුවූ ලංකාවේ පැරණිතම කාසිය

D සිත්තාරුබිම් බුදල්නා හට කෘතගුණ සැළකීම පිළිබඳව සඳහන් වන අභිලේඛන මූලාශ්‍රය

(පනාකඩුව තඹ සන්නස, වල්ලිපුරම් සන්නස, සංස්කෘත, බ්‍රාහ්මී, තඹ මස්ස, කහාපණ,රූප අදෙක, කාසි අදෙක) (ලකුණු 4)

iii. ඉතිහාසය ඉගෙන ගැනීමේදී ශිලා ලිපි වැදගත් වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv. පුරාවස්තු රැක ගැනීමේ වැදගත්කම කරුණු තුනක් යටතේ පැහැදිලි කරන්න. (ලකුණු 6)

(3) i. ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත්වූ පරිසර කලාප තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. A සිට D දක්වා ඇති ප්‍රකාශ වලට කෙටි පිළිතුරු සපයන්න.

A ලංකාව ජනාවාස කල මුල්ම මානවයා හඳුන්වන නම

B මෙරට අධික වර්ෂාපතනයක් ඇති භූ අවධිය

C ආදි මානවයා ගල් මෙවලම් තැනීමට භාවිතා කල පාෂාණ වර්ගයක්

D ප්‍රාග් ඓතිහාසික මානවයා ආහාර සපයාගත් එක් ක්‍රමයක් සඳහන් කරන්න

(ලකුණු 4)

iii. පූර්ව ඓතිහාසික යුගයේ කැපී පෙනුනු ලක්ෂණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv. මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්ති රටාවේ කැපී පෙනුන ලක්ෂණ තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(4) i. පූර්ව රාජ්‍ය සමයේ රාජ්‍ය පාලනයට සම්බන්ධවූ නිළධාරීන් තිදෙනෙක් නම් කරන්න (ලකුණු 3)

ii. ගම් ප්‍රධානියෙකුගෙන් ගමට සිදුවන සේවාවන් හතරක් ලියන්න (ලකුණු 4)

iii. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය උරුමය සිදුවූ ආකාරය නිදසුන් දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 5)

iv. රටේ ජනතාව රජතුමාගෙන් අපේක්ෂා කල සේවාවන් තුනක් විස්තර කරන්න. (ලකුණු 6)

(5) i. කෙටි පිළිතුරු ලියන්න

A ලංකාවට බුදු දහම පැමිණෙන විට මෙරට සිටි පාලකයා

B විමධ්‍යගතව පැවති දේශපාලනය මධ්‍යගත කළ අනුරාධපුර යුගයේ පාලකයා

C මින්නේරි දෙවියන් ලෙස පූජනීයත්වයට පත්වූ පාලකයා (ලකුණු 3)

ii. ලංකාවේ වියළි කලාපයේ වැව් පද්ධති තැනීමේ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 4)

iii. A පරුමකවරුන් "රජ" යනපදයෙන් තමන් හඳුන්වා ඇති බව සඳහන් වන සෙල්ලිපියක් නම් කරන්න.

B පරුමකවරුන් සතු කාර්යයන් දෙකක් පැහැදිලි කරන්න (ලකුණු 5)

iv. දේශපාලන බලය වර්ධනය කරගත් ශ්‍රේෂ්ඨ රජෙකු ලෙස වසභ රජුගෙන් සිදුවූ ප්‍රධාන සේවාවන් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(6) i. A ශ්‍රී ලංකාවේ වඩාත් පැරණිතම ගොවිතැන් ක්‍රමය කුමක්ද?

B වී වගා කරන කන්න දෙක නම් කරන්න (ලකුණු 3)

ii. කෙටි පිළිතුරු ලියන්න

A හේන වන සතුන් ගෙන් ආරක්ෂා කර ගැනීමට යෙදූ උපක්‍රම දෙකක් ලියන්න

B හේන් වගා කිරීම් වෙනුවෙන් අය කළ බදු වර්ග දෙකක් නම් කරන්න. (ලකුණු 4)

iii. අතීතයේදී ශ්‍රී ලංකාව අසල්වැසි රටවල් සමග රාජ තාන්ත්‍රික සම්බන්ධතා පැවැත්වූ ආකාරය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න

iv. A රට අභ්‍යන්තර වෙළඳාම පිළිබඳව බදුලු ටැම් ලිපියේ පනවා තිබූ නීති දෙකක් සඳහන් කරන්න.

B අතීත ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම සිදුවූ ආකාරය කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න.

(7) i. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා අතීතයේදී ඉදිවූ පොකුණු තුනක් නම් කරන්න. (ලකුණු 3)

ii. A සිට D දක්වා ඇති ප්‍රකාශ වලට නිවැරදි පිළිතුර තෝරා ලියන්න.

A ජල තරංග මගින් වැව් බැම්ම ඛාදනය වීම වැලැක්වීමට යොදා ඇති ව්‍යුහයේ නම

B වැව් ජලය වාරි ඇළ වෙත පිට කිරීමට යොදා ඇති ව්‍යුහය හඳුන්වන නම

C වැවෙන් පිටවන ජලයේ පීඩනය පාලනය කිරීමට යොදා ඇති ව්‍යුහය හඳුන්වන නම

D ගංගා හරස් කර ජලය රැස්කර ගැනීමට යෙදූ උපක්‍රමය හැඳින්වූ නම

(මොහොල, පිටවාන, අමුණ, බිසෝකොටුව, සොරොව්ව, රළපනාව, වැව් බැම්ම) (ලකුණු 4)

iii. පැරණි රජවරු මහ වැව් තැනුවේ ඇයිදැයි කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න (ලකුණු 5)

iv. අතීත ශ්‍රී ලංකාවේ රජවරු වෛද්‍ය විද්‍යාවේ දියුණුවට කළ සේවය කරුණු තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

(8) i මෙරට පැරණි සමාජ ධූරාවලියේ ඉහළම ස්ථරයේ සිටි පාර්ශව තුනක් සඳහන් කරන්න. (ලකුණු 3)

ii. පැරණි සාමාජ ධූරාවලියේ සාමාන්‍ය ජනතාව ( කුඩීන්) ලෙස සැළකූ පාර්ශව හතරක් නම් කරන්න. (ලකුණු 4)

iii. අතීත සමාජයේ ව්‍යංජන රසවත් කිරීමට යෙදූ ක්‍රම දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 5)

iv. මෙරට පැරණි සමාජය තුළ කාන්තාවන්ට ගෞරවණීය තත්වයක් හිමිවූ බව නිදසුන් තුනක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6)

REGISTRAR
De Mazenod College
Kandana.